*සැ. යු.*- 2017.01.06 වැනි දින පළ වූ අංක 2,001 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,002 - 2017 ජනවාරි මස 13 වැනි සිකුරාදා - 2017.01.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 8 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 9 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - යූඑන්වී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2016 දෙසැම්බර් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 පෙබරවාරි මස 03 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජනවාරි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

7- B 081133— 353 (2017/01)
D 1 -

# දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - රත්නපුර** මගේ අංකය : රත්.මහේ/ලේ.හා./2016.

කාලය ඉකුත් වූ නඩු වාර්තා විනාශ කිරීම
(කලවාන (සංචාරක) මහෙස්ත්‍රාත් අධිකරණය)

කලවාන (සංචාරක) මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලදුව අවසන් කරන ලද වර්ෂ 05කට වඩා පැරණි පහත උපලේඛනයේ *ගැසට් පත්‍රයේ* සඳහන් නඩු වාර්තා 2017.02.23 දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ දී පුළුස්සා විනාශ කිරීමට සූදනම් කර ඇත.

2. මෙම නඩු සම්බන්ධයෙන් යම් පාර්ශවකරුවෙකුට තමාට අවශ්‍ය සම්පූර්ණ පිටපතක් හෝ එකී යම් කොටසක් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් ඒ සඳහා ඉල්ලුම්පත්‍ර 2017.02.23 දිනට පෙර මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. එසේ ඉල්ලීමක් නොවුවහොත් පහත උපලේඛනයේ සඳහන් නඩු වාර්තා 2017.02.23 දිනෙන් පසුව මෙම අධිකරණ භූමියේ පුළුස්සා විනාශ කරන බව මෙයින් දන්වා සිටිමි.

සාලිය චන්න අභයරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය, රත්නපුර.

2016 දෙසැම්බර් මස 28 වැනි දින,
රත්නපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | 32 | 62 | 88 | 419 | 449 | 485 | 514 |
| 2 | 33 | 63 | 89 | 422 | 450 | 486 | 515 |
| 3 | 34 | 64 | 90 | 424 | 453 | 490 | 516 |
| 3 | 35 | 65 | 91 | 425 | 456 | 491 | 517 |
| 4 | 36 | 66 | 92 | 426 | 457 | 494 | 518 |
| 5 | 38 | 67 | 93 | 427 | 458 | 496 | 519 |
| 7 | 40 | 68 | 98 | 428 | 459 | 497 | 520 |
| 9 | 41 | 69 | 99 | 431 | 460 | 498 | 521 |
| 12 | 42 | 71 | 400 | 432 | 462 | 499 | 522 |
| 13 | 43 | 72 | 401 | 433 | 463 | 500 | 523 |
| 14 | 44 | 74 | 402 | 434 | 464 | 501 | 524 |
| 15 | 45 | 75 | 403 | 435 | 465 | 502 | 525 |
| 17 | 46 | 76 | 404 | 436 | 466 | 503 | 526 |
| 20 | 47 | 77 | 405 | 437 | 467 | 504 | 527 |
| 21 | 48 | 78 | 406 | 438 | 468 | 505 | 528 |
| 22 | 49 | 79 | 407 | 439 | 471 | 506 | 529 |
| 23 | 54 | 80 | 412 | 440 | 472 | 507 | 530 |
| 25 | 55 | 81 | 413 | 441 | 474 | 508 | 531 |
| 26 | 56 | 82 | 414 | 442 | 476 | 509 | 532 |
| 27 | 57 | 84 | 415 | 443 | 480 | 510 | 533 |
| 28 | 58 | 85 | 416 | 444 | 482 | 511 | 534 |
| 29 | 59 | 86 | 417 | 445 | 483 | 512 | 535 |
| 30 | 61 | 87 | 418 | 446 | 484 | 513 | 536 |
| 31 | | | | | 484 | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 537 | 558 | 577 | 599 | 616 | 643 | 660 | 689 |
| 538 | 559 | 580 | 600 | 617 | 644 | 661 | 690 |
| 539 | 560 | 582 | 602 | 618 | 646 | 667 | 690 |
| 540 | 561 | 583 | 603 | 619 | 647 | 670 | 692 |
| 541 | 564 | 584 | 604 | 620 | 648 | 671 | 693 |
| 542 | 565 | 585 | 605 | 621 | 649 | 673 | 694 |
| 543 | 566 | 587 | 606 | 622 | 650 | 675 | 695 |
| 546 | 567 | 588 | 607 | 623 | 651 | 677 | 696 |
| 547 | 568 | 590 | 608 | 624 | 652 | 679 | 697 |
| 548 | 569 | 591 | 609 | 625 | 653 | 680 | 698 |
| 549 | 570 | 592 | 610 | 627 | 654 | 682 | 699 |
| 550 | 571 | 594 | 611 | 628 | 655 | 682 | නඩත්තු |
| 551 | 572 | 595 | 612 | 632 | 656 | 683 | 206 |
| 552 | 573 | 596 | 613 | 634 | 657 | 686 | 244 |
| 553 | 574 | 597 | 614 | 635 | 658 | 687 | 292 |
| 554 | 576 | 598 | 615 | 636 | 659 | 688 | 433 |

01-409

---

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණයේ දී ය

**1994 අංක 9 දරන පනතින් සංශෝධිත 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳව යි**

සොෆ්ට්ලොජික් ෆයිනෑන්ස් පීඑල්සී,
අංක 01, ලේක් චන්ද්‍රවංකය,
කොළඹ 02,

*නව ලිපිනය :*
2 වන මහල,
අංක 33, උද්‍යාන පාර,
කොළඹ 03.

..................................*පැමිණිලිකරු.*

| | | |
|---|---|---|
| නඩු අංකය | : | DDR/107/2014 |
| ස්වභාවය | : | ණය අයකර ගැනීම |
| වටිනාකම | : | රු. 16,25,172.00 |
| ක්‍රියා පටිපාටිය | : | 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුව. |
| ඇස්කිසි අංකය | : | 51/16 (දිසා අධිකරණය, මීනුවන්ගොඩ) |

*එදිරිව*

1. ඉරිප්පුගේ රොෂාන් මැල්කම් ප්‍රනාන්දු,
   අංක 21/M/166, ඊ. ඩී. දබරේ මාවත,
   කොළඹ 08.

2. කුරුකුල ආරච්චගේ දෙන් ක්‍රිෂාන් සමන්ත නානායක්කාර,
   අංක 7/2, එස්. ටී. මාවත, බණ්ඩාරවත්ත, සීදූව

3. ගම්මාන විදානලාගේ ආනන්ද ධර්මරත්න,
ගුණ සෙවන, පල්ලියපිටිය, දූනගහ.

*නව ලිපිනය* : අංක 29/1/ඒ, ඉහල මඩම්පැල්ල, ඉහලගම
(මීරිගම හරහා)

.................................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2014 ක් වූ අගෝස්තු මස 07 වැනි දින නියත කර ඇති, වර්ෂ 2014ක් වූ ජූනි මස 10 වැනි දින නෛසයි තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, එකී නඩුවේ (1) වැනි විත්තිකරු විසින් වර්ෂ 2013ක් වූ දෙසැම්බර් මස 26 වැනි දිනට එනම් රුපියල් දහසය ලක්ෂ විසිපන්දහස් එකසිය හැත්තෑ දෙකක (රු. 16,25,172/-) ක මුදලක් හා එකී මුදල තුළ අන්තර්ගත ප්‍රාග්ධන මුදල වන රුපියල් හය ලක්ෂ හැත්තෑහය දහස් තුන්සිය හැත්තෑ තුනයි ශත අසූ හතරක (රු. 6,76,373.84) ක මුදලක් මුදල මත වර්ෂ 2013ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා වර්ෂයකට 42%ක පොලියක් ද, තීන්දු ප්‍රකාශිත දින සිට තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාල පොළිය ද, එම මුදල අයකර ගැනීම සඳහා සංශෝධිත වූ පරිදි 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාරව එකී විත්තිකරුවන්ට විරුද්ධව ඇතුලත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද ගෙවිය යුතු බවට ආඥාකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

තව ද, එකී විත්තිකරුවන් විසින් එකී මුදල් නිසි පරිදි ගෙවීම පැහැර හැර ඇති බැවින්, එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියේ බලයපිට නිසි ලෙස ලියා තහනමට ගෙන ඇති, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපලෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදල සෑම සියලු දේ වර්ෂ 2017ක් වූ පෙබරවාරි මස 01 වැනි දින පස්වරු 3.00ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කාර්යාලයට අයත්, අළුත්කුරු කෝරලේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 79 වරාදල ග්‍රාම නිලධාරී වසමේ, වරාදල පිහිටි 'දොඹවින්න' නැමති ඉඩමෙන් බෙද වෙන්කල කැබැලි අංක 247 දරන කොටසට මැණුම්පතිවරයා විසින් 2013.01.01 වැනි දින මැන සෑදූ කැඩස්තර සිතියම් අංක 51000 හි කලාප අංක 3 හි පත්‍ර අංක 29 දරන පිඹුරෙහි නිරූපිත එකී කැබලි අංක 247 දරන බිම් කොටසට මායිම්, උතුරට : කැබලි අංක 10 ද, නැගෙනහිරට : කැබලි අංක 12 ද, දකුණට : කැබලි අංක 15 සහ පාර ද හා බටහිරට : කැබලි අංක 248 මෙම ඉඩමේ කොටස ද තුළ පිහිටි විශාලත්වයෙන් අක්කර බින්දුවයි රූඩ් බින්දුවයි පර්චස් පහලොවක් (අ. 0, රූ. 0, පර්. 15) ක් හා හෙක්ටයාර 0.0379 ක් විශාල වූ ඉඩම හා ඊට අයත් සෑම සියලු දේත් සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ අංක 2533221 දරන හිමිකම් ලේඛනයේ ලියාපදිංචි වී ඇත.

තව ද, ඉහත අංක දරන නඩුවට යටතේ ඉහත දේපල කොළඹ අතිරේක දිසා විනිසුරු ජයකි ද අල්විස් මැතිණිය විසින් 2016.10.26 වැනි දින දී ඇති නියෝගයක් මත, ඉහත නම් සඳහන් (1) වන විත්තිකරු විසින් තම බිරිඳ වන තිහලවලාන කම්කානමලාගේ ප්‍රියංගා පුෂ්ප කුමාරි තිහලවලාන (ජාතික හැඳුනුම්පත් අංක 745092780 V) යන අයට 2014.08.19 වැනි දින කර ඇති පැවරීම තහනම් කර ඇත. එම තහනම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 2533221 දරන හිමිකම් ලේඛනයේ ලියාපදිංචි වී ඇත.

### දේපල පිහිටීම

මිනුවන්ගොඩ සිට කොටදෙණියාව හරහා වැටී ඇති මාර්ග අංක 5 කොළඹ - කුරුණෑගල මාර්ගයේ දිවුලපිටිය පසුකර හමුවන හීරළුගෙදර හන්දියෙන් වමට හැරී කිලෝමීටර් 2ක් පමණ ගමන් කළ විට හමුවන වරාදල පුරාණ විහාරය ඉදිරිපිට ඇති වෙන්දේසි ඉඩමේ මෙම දේපල පිහිටා ඇති අතර, එම ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්,

(i) ගැණුම් මිලෙන් 25%ක් ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට ප්‍රකාරව නියෝජ්‍ය පිස්කල් තැනගේ ගාස්තු ද,

(iii) විකුණුම සඳහා වන සියළුම වියදම් ද මුදලින් ගෙවිය යුතු ය. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහක් (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුලත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු යි.

ඒ. එම්. කේ. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්/සාම විනිසුරු,
දිසා අධිකරණය, මිනුවන්ගොඩ.

2016 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින දී ය.

01-408